# ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව
# காணி ஆணையாளர் நாயகத்தின் திணைக்களம்
# LAND COMMISSIONER GENERAL'S DEPARTMENT

"මිහිකත මැදුර", ඉඩම් මහලේකම් කාර්යාලය, 1200/6, රජමල්වත්ත පාර, බත්තරමුල්ල.
"மிஹிகத்த மெதுர", காணிச் செயலகம், 1200/6, இராஜமல்வத்த வீதி, பத்தரமுல்ல.
"Mihikatha Medura", Land Secretriat,1200/6, Rajamalwatta Road, Battaramulla.

☎ 011 279 7400
🖷 011 286 4051


මගේ අංකය / எனது இல / My No. L2/1/89/චක්‍රලේඛ/2022

ඔබේ අංකය / உமது இல / Your No

දිනය / திகதி / Date 2022.01.31

**චක්‍රලේඛ 2022/01**

සියළුම ප්‍රාදේශීය ලේකම්වරු,

**<u>රජයේ ඉඩම් තොරතුරු හා කළමණාකරණ පද්ධතිය (e-Slims) මගින් ඉඩම් රාජකාරී කටයුතු සිදු කිරීම අනිවාර්ය කිරීම</u>**

රජයේ ඉඩම් බැහැර කිරීම හා එසේ බැහැර කරන ලද ඉඩම්වල පසු කටයුතු සිදු කිරීම වඩාත් කාර්යක්‍ෂම කරලීම සඳහා රජයේ ඉඩම් තොරතුරු හා කළමණාකරණ පද්ධතිය (e-Slims) නිර්මාණය කිරීම සිදුකරන ලදි. එමගින් බලපත්‍ර, දීමනාපත්‍ර හා දීර්ඝ කාලීන බදුකර නිකුත් කිරීම වඩාත් කාර්යක්ෂමව සිදුකල හැකිවන අතර එසේ බැහැර කරනු ලබන ඉඩම්වලට අදාල පසු කටයුතු කිරීම පහසුවෙන් සිදු කිරීමට හැකියාව පවතී. එමෙන්ම සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකම පිහිටි රජයේ ඉඩම් පිළිබඳ නිරන්තරයෙන් යාවත්කාලීන වන දත්ත පද්ධතියක් පවත්වාගෙන යාමට හැකි වීම e-Slims පද්ධතිය මගින් ලැබෙන සුවිශේෂී ප්‍රතිලාභයකි.

02. බොහොමයක් ප්‍රාදේශීය ලේකම් කාර්යාල මගින් e-Slims පද්ධතිය නිසි පරිදි පරිහරණය කර බලපත්‍ර හා දීමනාපත්‍ර නිකුත් කිරීමට කටයුතු කරනු ලැබුවද සමහර ප්‍රාදේශීය ලේකම් කාර්යාල ඒ සඳහා ප්‍රමාණවත් උත්සාහයක් නොගන්නා බව නිරීක්ෂණය වී ඇත.

03. e-Slims පද්ධතිය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන යටිතල පහසුකම් සියලුම ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට ලබාදී ඇති බැවින් එම පද්ධතිය පරිහරණය කරමින් මහජනතාව වෙත ඉහල සේවාවක් ලබාදීමට ක්‍රියාකල යුතු වේ. ඒ අනුව ඉඩම් බැහැර කිරීම හා සම්බන්ධ සියළු කටයුතු e-Slims පද්ධතිය මගින් සිදු කිරීම තුළින් එම කාර්යයන් සඳහා ගතවන කාලය හා වියදම අවම කර ගත හැකිවනු ඇත.

04. ඒ අනුව 2022.03.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ බලපත්‍ර හා දීමනාපත්‍ර සකස් කිරීම මෙන්ම රජයේ ඉඩම් ආඥා පනත යටතේ බදු අනුමැතීන් ලබා ගැනීම, බදුකර සකස් කිරීම හා වාර්ෂික අවසරපත්‍ර නිකුත් කිරීම e-Slims පද්ධතිය මගින් පමණක් සිදු කිරීමට කටයතු කරන ලෙස මෙයින් උපදෙස් දෙනු ලැබේ.

05. e-Slims පද්ධතිය මගින් එම කාර්යයන් සිදු කිරීමේදී ක්‍රියා කලයුතු ආකාරය පද්ධතියේ මුල් පිටුවේ ඇති "උපකාර" අයිකනය තුලට ප්‍රවේශ වීමෙන් පහසුවෙන් පරිශීලනය කිරීමට හැකියාව ඇත. මීට අමතරව ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන පුහුණු වැඩසටහන් මගින් ද ඒ සඳහා ප්‍රමාණවත් පුහුණුවක් ලබාදීමට ක්‍රියාකරනු ඇත.

06. එබැවින් 2022.03.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ බලපත්‍ර හා දීමනාපත්‍ර නිකුත් කිරීමත්, රජයේ ඉඩම් ආඥා පනත යටතේ දීර්ඝ කාලීන බදු අනුමැතීන් ලබා ගැනීම, බදුකර හා වාර්ෂික අවසර පත්‍ර නිකුත් කිරීමත් e-Slims පද්ධතිය මගින් පමණක් සිදු කලයුතු බව කාරුණිකව දන්වා සිටිමි.

ජී.ඩී. කීර්ති ගමගේ

ඉඩම් කොමසාරිස් ජනරාල්

පිටපත් :

1. ජනාධිපති ලේකම්, ජනාධිපති ලේකම් කාර්යාලය - කරු. දැ.ගැ.ස.
2. ලේකම්, ඉඩම් අමාත්‍යාංශය - කරු. දැ.ගැ.ස.
3. සියළුම පළාත් ඉඩම් කොමසාරිස්වරු / අන්තර් පළාත් ඉඩම් කොමසාරිස්වරු
4. සියළුම අන්තර් පළාත් සහකාර ඉඩම් කොමසාරිස්වරු
5. ඉඩම් කොමසාරිස් පාලන / I /II / III

(3–5) - කරු. දැ.ගැස. හා අ.ක.ස.